016

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 8 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය :- ................................................................ කාලය: පැය 02යි.

### I කොටස

- සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- 01 සිට 05 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

(01) රජය විසින් නොමිලේ සපයනු ලබන පොදු සේවාවක් පහත සඳහන් පිළිතුරු අතරින් තෝරන්න.

(1) අධ්‍යාපනය
(2) විදුලිය
(3) පණිවුඩ හුවමාරුව
(4) ප්‍රවාහනය

(02) ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් ප්‍රකාශ කරන පරිදි, මෑතකදී ශ්‍රී ලංකාවෙන් සම්පූර්ණයෙන් ම තුරන් කරන ලද රෝගය කුමක් ද?

(1) ක්ෂය රෝගය
(2) මැලේරියාව
(3) පෝලියෝ
(4) ජලභීතිකාව

(03) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධව ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා පිහිටුවා ගෙන ඇති ජාත්‍යන්තර සංවිධානය වන්නේ,

(1) යුනෙස්කෝ සංවිධානය යි.
(2) නේටෝ සංවිධානයයි.
(3) යුනිසෙෆ් සංවිධානයයි.
(4) සාර්ක් සංවිධානයයි.

(04) ඈත අතීතයේ සිට ම අප රටේ මැටි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව වඩාත් ප්‍රසිද්ධියක් උසුලන්නේ,

(1) පිළිමතලාව යි.
(2) රදාවඩුන්න යි.
(3) වෙන්නප්පුව යි.
(4) මොළගොඩ යි.

(05) කිසිදු ආගමක් රාජ්‍ය ආගම ලෙස පිළිනොගන්නා බහු සංස්කෘතික සමාජයක් සහිත රට වන්නේ,

(1) ඉන්දියාව යි.
(2) ඇමරිකා එක්සත් ජනපදය යි.
(3) ස්විට්සර්ලන්තය යි.
(4) මහා බ්‍රිතාන්‍ය යි.

- 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

(06) ක්‍රීඩා කටයුතු වල යෙදීම තුළින් අයහපත් චිත්තවේග සමනය වේ. ( නි / වැ )

(07) ඉස්ලාම් බැතිමතුන් මහම්මත්තුමාගේ උපත සිහිකරමින් රාමසාන් උත්සවය පවත්වති. ( නි / වැ )

(08) අභියෝගවලට සාර්ථකව මුහුණදීම තුළින් ජීවිත ඉලක්ක ජයගත හැකි වේ. ( නි / වැ )

(09) සම්පත් අධි පරිභෝජනයෙන් වැළකී සිටීම තුළින් තිරසාර සංවර්ධනය සඳහා දායකවීමට අපට හැකිවේ. ( නි / වැ )

(10) පැලලුම් ශිල්පීන් තම කාර්යයන් සඳහා වැඩි වශයෙන් යොදවනු ලබන්නේ කායික ශ්‍රමයයි. ( නි / වැ )

- 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(11) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක ජීවත් වන ජනතාව ................................ තුළින් තම දේශපාලන නායකයන් තෝරා ගනිති.

(12) ජල පැපසුමෙහි ඌනතා හේතුවෙන් ඇතිවන නියඟය ................................ නියඟය ලෙස හැඳින්වේ.

(13) සමාජයේ පවතින පියවුම රැකියා අවස්ථා ................................ ලෙස හැඳින්වේ.

(14) පොලිසියේ ප්‍රධාන කාර්යය වන්නේ රටේ සාමය සුරැකීම හා ................................ සැපයීමයි.

(15) ................................ සිරීම මඟින් මානසික පීඩනය පාලනය කළ හැකි ය.

(මහජන ආරක්ෂාව , ජල විද්‍යාත්මක , භාවනා , වැඩ ලෝකය , මැතිවරණ)

- 16 සිට 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර හිස් ඉරි මත ලියන්න.

(16) ආපදා මඟින් ඇතිවන හානි අවම කර ගැනීමේ ක්‍රියාවලිය ................................ ලෙස හැඳින්වේ.

(17) අතීතයේ අප රටේ විසූ ජනතාව තම යුතුකම් නොපිරිහෙලා ඉටුකළ බව රොබට් නොක්ස්ගේ ................................ ග්‍රන්ථයේ සඳහන් වේ.

(18) කුඩා කල සිටම පුද්ගලයන් විසින් තම මනෝ සමාජීය කුසලතා ප්‍රගුණ කර ගැනීමෙන් ජීවිත ................................ ජයගත හැකි ය.

(19) තමන් විසින් ඉටුකරනු ලබන කාර්යය සතුටින් හා කැමැත්තෙන් යුතුව ඉටුකිරීම ................................ යනුවෙන් හැඳින්වේ.

(20) විවිධ සංස්කෘතික ලක්ෂණ දක්නට ලැබෙන ජන සමාජයන් ................................ සමාජ යනුවෙන් හැඳින්වේ.

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (i) ශ්‍රී ලංකාවේ මගී ප්‍රවාහනය සඳහා සේවා සපයන ආයතන දෙකක් නම් කරන්න.

(ii) පවුල තුල දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් නම් කරන්න.

(iii) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අප රට තුල ක්‍රියාත්මක වන ආයතන දෙකක් නම් කරන්න.

(iv) වර්තමානයේ අප මුහුණ දෙන විපත් වල ස්වභාවය අනුව ඒවා බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(v) ගංවතුර ඇතිවීම කෙරෙහි බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් නම් කරන්න.

(vi) රසායනික ද්‍රව්‍ය භාවිතයේ දී අනතුරු සිදුවිය හැකි ආකාර දෙකක් ලියා දක්වන්න.

(vii) එදිනෙදා ජීවිතයේ දී අප මුහුණ දෙන ගැටළු විසඳා ගැනීම තුලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.

(viii) ශුභ අභිමානයෙන් යුතුව කටයුතු කිරීම නිසා සේවා දායකයාට අත්වන ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න.

(ලකුණු 2 x 8 = 16)

(02) (1) පාසල් සිසුන්ගේ හා ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර ඇති විශේෂ සේවා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) සමූපකාර ව්‍යාපාරය තුලින් ජනතාවට ලබාදෙන සේවාවන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) (a) සෞඛ්‍ය සේවා

(b) අධ්‍යාපන සේවා භුක්ති විඳීමේ දී අප විසින් ඉටුකළ යුතු යුතුකම් තුන බැගින් ලියන්න. (ලකුණු 06)

(03) (1) ඔබේ පාසල තුල දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) අප ජීවත් වන සමාජය තුල දැකිය හැකි නායකත්ව ශෛලීන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) සමාජය තුල නායකත්වය හා අනුගාමිකත්වය දැකිය හැකි අවස්ථා කීපයක් පහත වගුවේ දක්වේ. එහි හිස්තැන්වල අංකයට අදාල වචනය පිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න. (ලකුණු 06)

| නායකයා | අනුගාමිකයා |
|---|---|
| පියා | 1. ........................ |
| 2. ........................ | ගුරු මණ්ඩලය, සිසු දරු දැරියන් |
| 3. ........................ | සෙසු ස්වාමීන් වහන්සේලා, දායක දායිකාවෝ |
| මන්ත්‍රීවරයා | 4. ........................ |
| 5. ........................ | රටවැසියන් |
| පංතිභාර ගුරුවරයා | 6. ........................ |

(04) (1) ලෝකයේ බහු සංස්කෘතික සමාජ පවතින රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) බහු සංස්කෘතික ජන සමාජයක දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ජාතික සමගිය හා තිරසාර සාමය ගොඩනගා ගැනීම තුලින් අත්පත් කරගතහැකි වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 06)

(05)



A



B

(1) ඉහත A, B පටතේ දක්වා ඇති ස්වභාවික ආපදා අවස්ථා දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) A අවස්ථාව ඇතිවීම කෙරෙහි බලපාන මානව ක්‍රියාකාරකම් දෙකක් ද, B අවස්ථාව නිසා ඇතිවිය හැකි අයහපත් ප්‍රතිඵලයක් ද සඳහන් කරන්න. (ලකුණු 03)

(3) a. තිරසාර සංවර්ධනය ඇති කිරීම සඳහා රටක පුරවැසියන් ලෙස අප විසින් සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ද. (ලකුණු 04)

b. වගා කටයුතුවල දී අධික ලෙස රසායනික ද්‍රව්‍ය භාවිත කිරීම නිසා ඇතිවන රෝගයක් ද. (ලකුණු 01)

c. අප ද්‍රව්‍ය නිසි ලෙස බැහැර නොකිරීම නිසා ඇතිවන රෝගයක් ද, ලියන්න (ලකුණු 01)

(06)



A



B

(1) ජීවන අභියෝග ජයගත් පුද්ගලයන් දෙදෙනෙකුගේ පින්තූර ඉහත A හා B වලින් දක්වා ඇත. ඔවුන් හඳුනාගෙන A හා B අනුපිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(2) ඔබ එදිනෙදා ජීවිතයේ දී මුහුණපාන අභියෝග තුනක් ලියන්න. (ලකුණු 03)

(3) අභියෝග ජය ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

නම් කිරීමට ලකුණු 02

පැහැදිලි කිරීමට ලකුණු 04 (ලකුණු 06)

(07) (1) ශ්‍රමය යෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) ශ්‍රී ලංකාව තුළ සිටින ශ්‍රමිකයන්ට වැඩ ලෝකය ජය ගැනීමට වෘත්තීය පුහුණුව ලබාදෙන ආයතන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(3) (a) ඕනෑම රැකියාවක නිරතවන පුද්ගලයෙකු සතුව පවතින අයිතිවාසිකම් තුනක් ද. (ලකුණු 03)

(b) සේවකයන් විසින් තම සේවා ස්ථානයට ඉටුකළ යුතු වගකීම් හා යුතුකම් තුනක් ද. ලියා දක්වන්න. (ලකුණු 03)